# සිංහල

## 7 ශ්‍රේණිය

## 15 පාඩම

## ලොවට තර්ජනයක් වන විද්‍යුත් අපද්‍රව්‍ය

බප/හො/පාතකඩ කනිෂ්ඨ විද්‍යාලය

# ලොවට තර්ජනයක් වන විද්‍යුත් අපද්‍රව්‍ය

- අප ජීවිතයේ විවිධ අරමුණු සඳහා විවිධ අවස්ථාවලදී ලේඛන කාර්යයන්හි නිරත වෙමු,

- මෙම පාඩමට ඇතුළත් වන්නේ ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය පිළිබඳව සකස් කරන ලද පුවත්පත් ලිපියකි.

- කාලීන පරිසර ගැටලුවක් පිළිබඳව දැනුම දියුණු කර ගැනීමට හා එදිනෙදා ජීවිතය සාර්ථක කර ගැනීමට මෙම ලිපිය හරහා සිදුවේ.

- මෙම ලිපිය සකස් කිරීමේදී කරුණු කිහිපයක් පිළිබඳව අවධානය යොමු කොට ඇති බව හඳුනාගත හැකිය.
  - ලිපියේ අරමුණ පැහැදිලි වන සේ මාතෘකාවක් යෙදීම.
  - මාතෘකාව පිළිබඳ හැඳින්වීම.
  - අතුරු මාතෘකා යටතේ කරුණු ගොණු කිරීම.
  - කතුවරයාගේ යෝජනා ඉදිරිපත් කිරීම.

# තොරතුරු සන්නිවේදන මාධ්‍ය

- තොරතුරු තවත් පිරිසකට ලබාදෙන මාධ්‍ය අතර මුද්‍රිත මාධ්‍ය ප්‍රමුඛස්ථානයක් ගනී.

- දැනුම හා විනෝදාස්වාදය ලබාදීම මෙමඟින් සිදු වේ.

- එවැනි මාධ්‍ය අතර,
  - පුවත්පත් ලිපි
  - බිත්ති පුවත්පත් ලිපි
  - සඟරා  වැදගත් තැනක් ගනී.

# පුවත්පත් ලිපි

- එදිනෙදා ජීවිතය පිළිබඳ තොරතුරු, දැනුම හා විනෝදාස්වාදය සපයන මාධ්‍යකි.

- විවිධ තරාතිරමේ පාඨකයන් ඉලක්ක කර ගනී.

උදා- තරුණ , ළමා , කාන්තා හා පොදු

මෙහිදී පාඨක පිරිසට අදාළ සුදුසු බස් වහරක්, මාතෘකාවට අදාළව නිර්මාණාත්මක හා සිත් ඇඳගන්නා සුළු ආකාරයට කරුණු ඉදිරිපත් කල යුතුය.

# බිත්ති පුවත්පත් ලිපි

- යම් පිරිසක් ඉලක්ක කර ගනිමින් තොරතුරු සපයයි.
- නිරන්තරයෙන් එම පිරිසට තොරතුරු කියවීමට හා තොරතුරු ප්‍රදර්ශනය කිරීමට හැකිය.
- බිත්ති පුවත්පතක ඇතුලත් කල හැකි ලිපි
  - ගද්‍ය ලිපි
  - කවි පන්ති
  - කෙටිකතා
  - විවිධ තොරතුරු - ක්‍රීඩා සමාජ සංස්කෘතික ආගමික
  - චිත්‍ර
  - පාසලක නම් ඊට අදාළ පාසල් ප්‍රවෘත්ති හා නිවේදන

# බිත්ති පුවත්පත් සැකසීමේදී සැලකිළිමත් විය යුතු කරුණු

- දිනපතා පුවත්පතක මුල් පිටුවේ ආකෘතිය අනුව සැකසීම,
- අදාළ පුවතේ නම, දිනය , පළකරන්නේ කවුද ආදී තොරතුරු ඇතුළත් කිරීම.
- ප්‍රධාන සිරස්තලය සහිත වාර්තාව
- ඡායාරූප හෝ සිතුවමක් සමඟ විස්තරයක්
- සංස්කාරක සටහන්

# බිත්ති පුවත්පත් ඉදිරිපත් කල හැකි ආකාර

පුවත්පත් සකස් කල හැකි ආකාර කිහිපයකි.

- විවිධ තේමා යටතේ,
  - සංස්කෘතික උරුම
  - ජාතික වීරයෝ
  - අපේ පඬිවරු

- කලාප වශයෙන්,

- විශේෂ කරුණු හා දිනයන් අනුව,
  - අළුත් අවුරුදු
  - නත්තල
  - වෙසක්

# සඟරා

- බිත්ති පුවත්පතක මෙන්ම සඟරාවකට ද විවිධ නිර්මාණ විචිත්‍රාංග ඉදිරිපත් කල හැක.

- සතිපතා, මාසික, ත්‍රෛමාසික වශයෙන් කාල සීමා අනුව ඉදිරිපත් කල හැක.

- පාසලක නම් පන්ති , විෂය , සංගම් හා විද්‍යාලයීය මට්ටමෙන් සඟරා ඉදිරිපත් කල හැක.

# පද බෙදීම

- සිංහල ලේඛන ව්‍යවහාරයේදී පද බෙදා ලිවීම අත්‍යවශ්‍ය වේ.

- වාක්‍ය ලිවීමේදී සියලුම පද එක දිගට සම්බන්ධර ලියුවහොත් කියවීමට හෝ අසා තේරුම් ගැනීමට හෝ නොහැකි වේ.

- සියළු පද හෙවත් වචන ලිවිය යුත්තේ එකිනෙක අතර පරතරය ඇතිවන පරිද්දෙනි. එය පද බෙදීමයි.

- වාක්‍යයක පද බෙදන ආකාරය අනුව අර්ථය වෙනස් වේ.

  - මල්ලී ලාභය ගැන නොසිතූ බව පෙනේ.
    මල්ලීලා භය ගැන නොසිතූ බව පෙනේ.

  - තේ වතුර ජයපාල නයට ගනී.
    තේ වතු රජය පාලනයට ගනී.

# පද බෙදන ආකාර

- වචනයක අඟට වලින්, ගේ , වල ,හි ,වල් ,ගෙන් යන ප්‍රත්‍ය යෙදෙන විට එය එක්කොට ලිවිය යුතුය
    - පඳුරැවලින්
    - සතුන්ගේ
    - විල්වල
    - වනයෙහි
    - ගවයන්ගෙන්
    - අඩිපාරවල්
- වචනයක මුලට උපසර්ගයක් යෙදෙන විට එක්කොට ලිවිය යුතුය. මෙහිදී පර, දු , නි , අව , අභි , අනු , උප , පිළි වැනි උපසර්ග ගත හැක.
    - පරසිරිත්
    - සුපිරිසිදු
    - අවමානය
    - අනුශාසක
    - පිළිසරණ
    - දුසිරිත්
    - නිවහල්
    - අභිරුචිය
    - උපනායක